# 10

# බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන විකාශනය

**ඩබ්.එම්.ජ්.කේ. විජේකෝන්**

---

**සාරාංශය**

*නව සහස්‍රකයේ අභිනව ප්‍රවේශයක් වනුයේ, තොරතුරු මූල සමාජ (Information based society) බිහි වීමයි. මෙය හුදෙක් ඓතිහාසික සමාජ පරිණාමයේ ගතික පියවරකි. ඒ අනුව නව සහශ්‍රය තුළ තොරතුරු සහ තොරතුරු මධ්‍යස්ථාන (Information and Information centers) ජාලගත කෙරෙමින්, ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය ද තොරතුරු සමාජ ක්‍රමයකට අනුවර්තනය වෙමින් පවතී. මෙම පසුබිම මත මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස (Buddhist Cultural heritage) මෙ රට සංස්ථාපනය වූ ආකාරය හා ස්වභාවය පිළිබඳ විශ්ලේෂණයක යෙදීමයි. එය නව සහශ්‍රකයේ අභියෝග හා සාපේක්ෂව දැනුම් සමාජයක් (Knowledge Society) කරා විස්ථාපනයේ දී, පදනම ලෙස වැදගත් වනු ඇත. සමාජ පරිනාමයේ හැරවුම් ලක්ෂය ලෙස විශේෂ නව ගෝලීයකරණ සමාජ විභවතා තුළ නව දිශනති කරා යොමු වීමේ දී, පැවති, පවත්නා සහ ගොඩ නැගෙමින් පවත්නා සමාජ පදනම් නිවැරදි ව හඳුනා ගැනීම සමාජ සංවර්ධනයේ ගාමක බලවේගයක් ලෙස වැදගත් වන හෙයිනි. මේ අනුව මෙම පර්යේෂණයෙන් ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස මෙරට සංස්ථාපනය, විකාශනය, හා එහි ස්වභාවය සහ ඊට බල පෑ හේතු සාධක හඳුනා ගනු ලැබ ඇත. එය අතීත බෞද්ධ සංස්කෘතික උරුමයන් වත්මන් සමාජ අභියෝග හමු වේ, කාලානුරූපව කළමනාකරණය කර ගැනීමේ දී මාර්ගෝපදේශයක් වනු ඇත.*

මූලික පද : ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන, පැරණි පුස්තකාල, උරුම කළමනාකරණය

## හැඳින්වීම

වත්මන් ගෝලීයකරණ සමාජ විභවතා තුළ නව ප්‍රවේශයක් වනුයේ, සමස්ත ලෝකය විශ්ව ගම්මානයක් (Universal Village) ලෙස හැකිලෙමින් තොරතුරු මූල

සමාජයකට (Information based society) පරිවර්තනයයි. ඓතිහාසික සම්ප්‍රදායික තොරතුරු මධ්‍යස්ථාන හෙවත් පුස්තකාල සංකල්පීය හා වාස්තවික වශයෙන් විපරිණාමනය වෙමින්, සංඛ්‍යාංක, විද්‍යුත්, ඉලෙක්ට්‍රොනික වශයෙන් නාමගත අතාත්වික විද්‍යුත් තොරතුරු මධ්‍යස්ථාන බවට පරිවර්තනය වෙමින් පවති. සමස්ත ලෝකය "අධිවේගී සුපිරි තොරතුරු මාවත" (Information Super highway) හරහා විශ්ව ව්‍යාප්ත විද්‍යුත් තොරතුරු ජාලයකට අනුගත වෙමින් පවති. මෙම සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තොරතුරු මධ්‍යස්ථාන හෙවත් පුස්තකාල ද ජාලගත තොරතුරු සමාජ ක්‍රමයට අඩු වැඩි ලෙස අනුවර්තනය වෙමින් පවති. මෙය හුදෙක් ඓතිහාසික සමාජ සංවර්ධනයේ ගතික පියවරකි. අවස්ථාවකි.

මෙම පසුබිම මත මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන මෙරට ස්ථාපනය වූ ආකාරය සහ එහි ස්වභාවය පිළිබඳ ව විශ්ලේෂණයක යෙදීමයි. එය නව තොරතුරු සමාජයේ අභියෝග හා සාපේක්ෂව දැනුම් සමාජයක් (Knowledge society) කරා විස්ථාපනයේ දී පදනම ලෙස වැදගත් වනු ඇත. සමාජ පරිණාමයේ හැරවුම් ලක්ෂය ලෙස විශේෂ නව සහස්‍රයේ නව දිසානති කරා යොමු වීමේ දී, පැවති සහ පවත්නා සමාජ පදනම් නිවැරදි ව හඳුනා ගැනීම සමාජ පරිවර්තනයේ ගාමක බලවේගයක් ලෙස වැදගත් වන හෙයිනි. මෙම පර්යේෂණගත තොරතුරු වලින් හෙළි වනුයේ, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන හෙවත් පුස්තකාල බෞද්ධ සංස්කෘතික උරුමයක් (Buddhist Cultural Heritage) ලෙස බිහි වී ඇති බවයි.

ලෝකයේ විවිධ පැරණි යුග ශිෂ්ටාචාර හා තොරතුරු මධ්‍යස්ථාන බිහිවීම සම්බන්ධව කරුණු සළකා බැලීමේ දී පෙනියන්නේ, ඒවාට අදාළ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන එම සමාජ ක්‍රමයන්හි විවිධ පැතිකඩ හා බද්ධ වෙමින් ආරම්භ වී ඇති බවයි. එහෙත් ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භයට අදාළ විශේෂ ලක්ෂණයක් වනුයේ, මෙ රට පැරණි යුග පුස්තකාල හෙවත් තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙසම බිහි වී ඇති බවයි. ඒ බව මෙරට ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපනය හා එහි ස්වභාවය ආශ්‍රිත පර්යේෂණගත තොරතුරු වලින් පැහැදිලි ව හඳුනා ගැනීමට ඇත.

ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන සංස්ථාපනය හා එහි ස්වභාවය පිළිබඳ ව ඉතිහාසය හෙළි කර ගැනීම, වත්මන් සමාජ අභියෝග හමුවේ එහි බල මූලයන් සවිබල ගැන්වීමෙහිලා සහ හැසිර වීමෙහිලා වැදගත් වනු ඇත. හේතුව " වත්මන් සමාජ බල මූල නිර්මාණය වී ඇත්තේ ඓතිහාසික සමාජ බල මූල විකාශනයන්හි ප්‍රතිඵලයක් ලෙසය" යන සත්‍යය බැහැර කළ නොහැකි නිසාවෙනි.

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ තොරතුරු මධ්‍යස්ථාන පිළිබඳ ඓතිහාසික තොරතුරු විශ්ලේෂණය කෙරෙන අධ්‍යයනයක් වනු ඇත. ඒ අනුව, මෙය ඓතිහාසික පර්යේෂණයකි. මෙහි දී පර්යේෂණ අරමුණට අදාළව දත්ත රැස් කිරීමේ මූලාශ්‍ර වශයෙන් අභිලේඛන, වංශකථා, ඓතිහාසික වාර්තා සහ ග්‍රන්ථ, තත්කාලීන සිංහල, පාළි, සංස්කෘත භාෂාගත ප්‍රාථමික, ද්විතියික තොරතුරු, මූලාශ්‍ර කරගනු ලැබ ඇත. මෙම පර්යේෂණය පැවති සමාජ සත්තා පවත්නා සහ ගොඩනැගෙමින් පවත්නා සමාජ සත්තා සහ සම්බන්ධතා පූර්වකව ගලපා ගැනීමේ අධ්‍යයනයක් වනු ඇත.

## ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන ආරම්භය

මානව ශිෂ්ටාචාරයේ අභිවර්ධනයට හේතු වූ මූලික කරුණක් ලෙස මිනිසා තම අදහස්උදහස්, සිතුම්පැතුම්, සංකේත මාර්ගයෙන් ලියා දැක්වීමට ගත් උත්සාහය විශේෂ වේ. එය අක්ෂර හා අක්ෂර ක්‍රම බිහි වීමට ප්‍රබල හේතුවක් විය. අක්ෂර හා අක්ෂර ක්‍රම ප්‍රායෝගික භාවිතයේ යෙදවීම ලේඛන කලාව බිහි වීමට හේතු සාධක විය. ලේඛන කලාවේ දියුණුව කාලක්‍රමානුගතව විවිධ ලේඛන මාධ්‍ය බිහි වීමට හේතු විය. විවිධ ලේඛන මාධ්‍ය බිහි වීමට සාපේක්ෂව ලේඛන මාධ්‍ය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව සමාජගත විය. එය තොරතුරු මධ්‍යස්ථාන හෙවත් පුස්තකාල බිහි වීමේ ආරම්භය සඳහා පාදක විය.

ආර්ය සංස්කෘතියකට උරුමකම් කී ඉන්දියාවේ සිට සිදු වූ විජයාවතරණය මෙරට සමාජ, ආර්ථික, සංස්කෘතික පරිසරයේ විශේෂ වෙනසකට හේතු විය. මහින්දාගමනය සමඟ බුදු දහම මෙරට සංස්ථාපනය වීම එය ප්‍රවේගවත් කළේය. මහින්දාගමනය සමඟ මුඛ පරම්පරාගතව පැවති ධර්මය ලියා තැබීමේ අවශ්‍යතාව ඇති විය. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ පමණ සිට මෙරට ලේඛන කලාව සමාජ ගත වූ බවට සෙල්ලිපි සාක්ෂි දරයි. (Muller 1994:No 20.p 30) ධර්මය ලියා තැබීම සඳහා ලේඛන කලාව සහ ලේඛන මාධ්‍ය භාවිතය සමඟ ලේඛන මාධ්‍ය බිහි වීමේ වේගය ප්‍රබල විය. විවිධ ලේඛන මාධ්‍ය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව මත විහාරාරාමවල "පොත් ගුල්" බිහි විය. මෙය ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන සංස්ථාපනය වූ ආකාරය වශයෙන් විශේෂ වේ. ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බිහි වීමේ ඉතිහාසය වශයෙන් විශේෂ මෙම ක්‍රියාදාමය තුළින් විශද ද වනුයේ, බුදු දහම මෙරට තොරතුරු මධ්‍යස්ථාන විකාශනයෙහිලා ප්‍රාරම්භක ලක්ෂය වී ඇති පවයි. මේ බව තහවුරු කෙරෙන ඓතිහාසික සාධක රාශියකි.

**තොරතුරු මධ්‍යස්ථාන විහාරාරාමවලට අනුබද්ධව බිහි වීම**

බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බිහි වීම තහවුරු කෙරෙන ප්‍රබල සාධකයක් වශයෙන් ඒවා විහාරාරාම සහ විද්‍යායතන වලට අනුබද්ධව පිහිටුවීම ගත හැකිය. බුදු දහම මෙරට ස්ථාපනය වීමට සාපේක්ෂව අධ්‍යාපනය ආගමික අධ්‍යාපනයක් විය. අධ්‍යාපනය ආගමික ආයතනයන්ට සම්බන්ධ විය. එම ආගමික ආයතන භාරකත්වය භික්ෂූන් සතු විය. එම නිසා ආගමික දැනුම හා තොරතුරු එකතු කිරීමේ, ආරක්ෂා කර ගැනීමේ, පවත්වාගෙන යාමේ සහ බෙදාහැරීමේ මූලිකත්වය භික්ෂූන් සතු විය. මෙම හේතු ඉහත තත්ත්වය සඳහා බලපානු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ ඉපැරණි තොරතුරු මධ්‍යස්ථාන, විහාරාරාම හා පිරිවෙන් වලට සම්බන්ධව ආරම්භ වීමේ ඉතිහාසය මූලික වශයෙන් අනුරාධපුර යුගයෙන් (ක්‍රි.පූ. 377-1,052) ආරම්භ වේ. දේවානම්පියතිස්ස රජු විසින් කරවන ලද "තිස්සාරාම පිරිවෙන" ලක්දිව පිහිට වූ පළමු පිරිවෙන ලෙස මහාවංශයේ හැඳීන් වේ. " කාලප්‍රසාද පිරිවෙන" (මහා වංශය 15. 222-223) වශයෙන් ද නාමික එම පිරිවෙනට පසු සුනනාථ (ම.ව.15.226) දීඝ වංකමන (ම.ව.15. 227) ඵලග්ග (ම.ව.15. 228-229) මාරුගණ (ම.ව. 15. 230) යන පිරිවෙන් එතුමා විසින් කර ඇත. මහාවංශ කර්තෘ වූ "මහානාම හිමි" වැඩ සිටි දීඝානන්ද සෙන්පති පිරිවෙන (ම.ව. 15. 230-231) බුද්ධඝෝෂ හිමි වැඩ සිටි "ග්‍රන්ථාකාර විහාරය" ආශ්‍රිතව පොත්ගුල් පැවති බවට සාක්ෂි වේ. මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය අනුබද්ධිතව පොත් ගුල් පැවති බවට ඉතිහාසය සාක්ෂි දරයි. එ කළ රුහුණේ තිස්සමහාරාමය (ම.ව. 22.23) ප්‍රධාන අධ්‍යාපන ආයතනයක් විය. "පබ්බතාරාමය", "සිතුල්පව්ව", (ම.ව. 22-23) කපුගම් පිරිවෙන එකල රුහුනේ පැවති විද්‍යායතන ලෙස වැදගත් වේ.

පොළොන්නරු යුගයේ (1065-1226) ඉපැරණි පුස්තකාල ආගමික ආයතන හා අනුබද්ධව පැවති බවට සාධක රාශියකි. පොළොන්නරුවේ පළමු පරාක්‍රමබාහු රජු පිරිවෙන් තුන්සිය හැට හතරක් කර වූ බව (රාජරත්නාකරයේ 104) සඳහන් වේ. එතුමා විසින් පූර්වාරාමය, දක්ෂිණාරාමය, උත්තරාරාමය, පශ්චිමාරාමය, ජේතවනාරාමය, ලංකාතිලකාරාමය හා තිවංකය (නිකාය සංග්‍රහය 21) යනාදී අධ්‍යාපන ආයතන පිහිටුවා ඇත. ආලාහන පිරිවෙන (ම.ව. 78. 49-53) එතුමාගේ අනෙකුත් ප්‍රකට අධ්‍යාපන ආයතන ලෙස වැදගත් වේ. මහා පරාක්‍රමබාහු රජ රුහුණේ පුස්තකාල 128ක් සෑද වූ බව ඉතිහාසගත කරුණකි. පළමු වැනි විජයබාහු, නිශ්ශංකමල්ල යනාදී රජවරුන් ද (රාජාවලිය 202 - 203) විහාරාරාම හා පිරිවෙන් පිහිටවූවන් ලෙස වැදගත් වේ.

දඹදෙණි යුගය (13-14 සියවස) (1236-1277) කෝට්ටේ යුගය (15 සියවස) (1410-1277) ආශ්‍රිත ආගමික ආයතන අනුබද්ධ ව ද පුස්තකාල පැවතී ඇත. කෝට්ටේ යුගයේ 6 වන පරාක්‍රමබාහු රජ පුස්තකාල උදෙසා ගොඩනැගිලි සෑද වූ බව " පැපිලියාන" සෙල්ලිපියෙන් කිය වේ. සමකාලීනව පැවති තොටගමුවේ විජයබා, මුල්කිරිගල, ඉරුගල් බණ්ඩාර, පැපිලියානේ සුනේත්‍රා දේවි, වීදාගම සනානන්ද යන අධ්‍යාපන ආයතන හා සම්බන්ධිත පුස්තකාල වලින් ද ප්‍රකට වනුයේ, බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස කාලක්‍රමානුගතව ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බිහි වූ බවයි.

## බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බොදු සංස්කෘතික උරුමයක් ලෙස බිහි වූ බව තහවුරු කෙරෙන තවත් සාධකයක් ලෙස බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය වැදගත් වේ. බුදු දහම මෙ රට ස්ථාපනය වීමත් සමගම බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය සමාජගත විය. මෙලෙස ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනයේ ස්වරූපය " පුරාතන ඉන්දීය අධ්‍යාපනය" කෘතියේ (Mukaraj 1960) මෙසේ ඉදිරිපත් කරනු ලබයි. "ශ්‍රාවක භික්ෂුවගේ ඉතිහාසය බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ ඉතිහාසය යි. වෛදික පිළිවෙත යාග හෝම මුල් කොට පැවැත්තා මෙන්, භික්ෂුවගේ බෞද්ධ අධ්‍යාපනය විරාගය මූලික කොට සිදු විය." මේ අනුව එකළ අධ්‍යාපනය ස්මරණය හා ධාරණ ශක්තිය මත පදනම් විය. දැනුම මුඛ පම්පරාගතව පවත්වාගෙන ඒම මූලික අධ්‍යාපන ක්‍රමවේදය විය. ඒ අනුව අධ්‍යාපනය භාණක, ගණ, පොරාණ වශයෙන් නාම ගත ගුරු පරම්පරා යටතේ වාචික මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලැබ ඇත. ආගමික ශික්ෂණය මෙම අධ්‍යාපන ක්‍රමයේ මූලික පදනම බව ද පැහැදිලි කරුණකි.

ලක්දිව බෞද්ධ අධ්‍යාපනය මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය යන ප්‍රධාන බෞද්ධ ආයතන ත්‍රිත්වය මූලික කරගෙන ආරම්භ වී ඇති බව පැහැදිලි කරුණකි. මහා විහාරයේ ථේරවාදී බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, අභයගිරිය හා ජේතවනාරාමයේ මහායාන බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය ආශ්‍රිතවත් අධ්‍යාපන පරිපාටිය සිදු වී තිබුණි. භාණක සම්ප්‍රදාය පදනම් කර ගනිමින් ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනය පසු කාලීනව ගුරුකුල හා නිකාය භේදය අනුව යම් යම් වෙනස්කම්වලට ලක් විය. එකල භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම පිළිබඳ වූ ග්‍රන්ථධූර හා විදර්ශනාධූර පිළිවෙත් පදනම අනුව යමින් ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී භික්ෂු ආයතන බිහි විය. (ම.ව. 33 පරි. 134) මෙය නිකායික වශයෙන් පිරිවෙන් බිහිවීමටත්, අධ්‍යාපනයේ විවිධතා ඇති වීමටත් හේතු විය. පසුව පිරිවෙන් අධ්‍යාපනයේ වැඩි දියුණු අවස්ථාවක් ලෙස මූලායතන (ම.ව. 59 පරි. 59 ගාථාව) සමාජගත විය. ඓතිහාසික සාධක අනුව, 1. උතුරු මූල, 2. දකුණු මූල, 3. කපාර

මූල, 4. වාදුම් මූල, 5. මහනෙත් පාමුල, 6. සෙනවිරත් මූල, 7. විල්ගම්මූල හා 8. ගල්තුරු මූල යනා දී වශයෙන් වූ අෂ්ට මූලායතන මුල් කරගෙන බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය විකාශිතව ඇති බව පෙනේ.

මුල් කාලීව බෞද්ධ අධ්‍යාපනයේ භාෂා මාධ්‍ය හෙළ බස බව පැහැදිලි කරුණකි. බුදු දහම සමඟ මෙ රටට ලැබුණු අක්ෂර කලාව හා පෙළ දහම පොදු ජන යහපත උදෙසා සිංහලයට නගනු ලැබ ඇත. මුල්කාලීනව සෙල්ලිපි, අටුවා, වංශ කතා, සූත්‍ර ධර්ම, වෛද්‍ය ශාස්ත්‍ර යනාදිය සිංහල බසින්ම ලිය වී ඇති බවට ඓතිහාසික සාක්ෂි වේ. භික්ෂු අධ්‍යාපනයේ මූලික විෂය ලෙස මහා විහාරය ආශ්‍රිතව හෙළබස, ත්‍රිපිටකය හා අටුවා උගන්වනු ලැබ ඇත. අභයගිරි නිකායික පිරිවෙන් ආශ්‍රිතව ඉහත විෂය හා ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය, භූත විද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය, සංස්කෘත භාෂාව යනා දී විෂයයන් ප්‍රගුණ කරනු ලැබ ඇත. උක්ත අධ්‍යාපන පසුබිම බුද්ධඝෝෂ හිමියන් හෙළ අටුවා පාළියෙන් ලිවීමත් සමඟ වෙනස්කම් වලට භාජනය වී ඇත. මේ අනුව ග්‍රන්ථකරණය හා අධ්‍යාපනික භාෂා මාධ්‍ය ලෙස පාළි හා සංස්කෘත භාෂා යොදාගෙන ඇත. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ දී සිංහලය අධ්‍යාපනික භාෂා මාධ්‍ය වශයෙන් නැවත වැදගත් වූ බව අග්බෝ රජ දවස විසූ දොළොස් මහා කවීන්ගේ කෘති හා සීගිරි කැටපත් පවුරේ ලියවුණ කුරුටු ගී වලින් තහවුරු වේ.

පොළොන්නරු යුගයේ බෞද්ධ අධ්‍යාපනය පිරිවෙන් හා මූලායතන ආශ්‍රිතව විකාශනය වී ඇත. මෙම යුගයේ දී අධ්‍යාපන කටයුතු, භාෂා මාධ්‍ය, විෂය, ග්‍රන්ථකරණය යනා දී ක්ෂේත්‍රවල යම් යම් වෙනස්කම් සිදු වී ඇත. ගිහි හා පැවිදි දෙපක්ෂය අතර අධ්‍යාපනික ප්‍රබෝධයක් ඇති වීම, පාළි, සංස්කෘත භාෂා භාවිතය, පාළි සංස්කෘත සිංහල යන ත්‍රිවිධ භාෂා භාවිතයේ වර්ධනයක් ඇති වීම, මිශ්‍ර සිංහල ව්‍යවහාරය යනා දි වෙනස්කම් මේ අනුව සිදු වී ඇත. බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය ආශ්‍රිත උක්ත තොරතුරු වලින් ප්‍රකට වනුයේ, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන ඒ හා අනන්‍යව විකාශනය වූ ආකාරය යි.

**ලේඛන කලාව භික්ෂූන් සතු වීම**

ලේඛන කලාව භික්ෂූන් සතු වීම, ලක්දිව ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බොදු උරුමයක් ලෙස විකාශනය වූ බවට ප්‍රබල සාධකයකි. මහින්දාගමනයෙන් පසු භික්ෂූන් අත මුඛ පරම්පරාගතව පැවති ධර්මය භික්ෂු මූලිකත්වයෙන් ග්‍රන්ථාරූඪ කිරීම ආරම්භ විය. ක්‍රිස්තු වර්ෂ පෙර 29 සිට 17 දක්වා රජ වූ වළගම්බා රජ දවස මාතලේ අළු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම මෙහිලා ප්‍රබල සාධකයකි.මෙකළ සිංහල අටුවා විශාල ප්‍රමාණයක් ද භික්ෂු කර්තෘත්වයෙන් ලිය වී ඇත. මෙයට හේතුව ලේඛන කලාව භික්ෂූන් සතුවීමත්, උගතුන් ලෙස සමාජ

සම්භාවනාවට ලක් වී ඇත්තේ භික්ෂූන් වීමත් ය. බුරුමයේ සුමංගල නම් ලේඛකයා විසින් ලියූ "බුද්ධඝෝසුප්පත්ති" කෘතියේ සඳහන් පරිදි, "එකළ ලංකාවේ පැවති සිංහල ග්‍රන්ථ ප්‍රමාණය මධ්‍යම තරමේ ඇතුන් සත් දෙනෙකුගේ උස ප්‍රමාණය යි." යන්නෙන් භික්ෂු වගකීම් භාරය තුළ නිෂ්පාදිත ග්‍රන්ථ ප්‍රමාණයේ විශාලත්වය පැහැදිලි වේ.

දේවානම්පියතිස්ස රජ දවස (ක්‍රි.පූ. 247-207) සිට මහානාම රජ දවස (ක්‍රි.ව. 409-404) කාලයේ සිංහල අටුවා භික්ෂු වගභාරය තුළ බිහි වීමෙන් සනාථ වනුයේ ද ලේඛන කලාවෙහි ලා ඔවුන්ගේ බලපෑමයි. මුළින්ම "බුද්ධඝෝෂ" හිමියන් විසින් " විසුද්ධිමග්ගය" හා "සුමංගල විලාසිනි" ලිවීය. පසුව මෙම හිමියන් විසින් ම මහාට්ඨකථා, මහා පච්චරිය, කුරුන්දී යන ත්‍රිවිධ අටුවා මූලාශ්‍ර ගනිමින් හෙළ අටුවා ග්‍රන්ථාරූඪ කිරීම සිදු කර ඇත. (මහාවංශය 37. 227-232) බුද්ධඝෝෂ හිමියන් සූත්‍ර හා විනය පිටක සඳහා අටුවා රාශියක් ලියනු ලැබ ඇත.

බුද්ධ දත්ත, ධම්මපාල යනාදි අටුවාචාරීන් විසින් එකල ලියූ විනය අටුවාව, දීඝ නිකාය අටුවාව, මජ්ජිම නිකාය, අංගුත්තර නිකාය යනාදි අටුවා වලින් ද පැහැදිලි වනුයේ භික්ෂු කර්තෘත්වයේ බලපෑමයි. බුද්ධදත්ත හිමි රචනා කළ ග්‍රන්ථ අතර අභිධර්මාවතාරය වැදගත් වේ. එය බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධිමග්ගයට සමාන වන අතර බෞද්ධ දර්ශනයට ප්‍රවේශ ග්‍රන්ථයක් ලෙස ද සළකනු ලැබේ. මධුරත්‍ථ විලාසිනී, ජිනාලංකාරය, විනය විනිච්ඡය, රූපාරූප විභාගය, උත්තර විනිච්ඡය (ලංකා පාලි සාහිත්‍ය, 32-33) උන් වහන්සේගේ අනෙකුත් කෘති වේ.

ශ්‍රී මහා බෝධි ශාඛාව ලක්දිව වැඩම වූ පසු ලියවුණු සිංහල බෝධිවංශය, දාඨනාග හිමිගේ ආරාධනයෙන් උපතිස්ස හිමි ලියූ "පාළි බෝධි වංශය" ද මෙහිලා නිදසුන් වේ. කිත්සිරිමෙවන් රජ දවස දළදාව ගෙන ඒමෙන් පසු ලියවුණු දළදාවංශය, 12 සියවසේ වාචිස්සර හිමි ලියූ පාළි ථූපවංසයට පදනම් වූ සිංහල ථූපවංශය භික්ෂූන් අත ලේඛන කලාව පැවති බවට නිදසුන් වේ. මෙහි සුළු හෝ වෙනසක් දැකිය හැක්කේ 5 වන සියවසින් පසුව ය. මහාවංශයේ සඳහන් පරිදී කාශ්‍යප හා මුගලන් රජවරු අසාමාන්‍ය කවියෝය. අග්බෝ රජ දවස දැමි, තෙමල්, බැදැරියෝ යනාදී වශයෙන් දොලොස් මහා කවීන් සිට ඇත. සළමෙවන් රජ කාව්‍යදර්ශය, කුමාරදාස රජ ජානකීහරණය, බුද්ධදාස රජ සාරාර්ථ සංග්‍රහය ලියනු ලැබීය. රජවරුන් හා පඬිවරුන් ලේඛන කලාවට ගිහියන් ලෙස සම්බන්ධ වුව ද ඒ ඉතා අල්ප බව "නාගසේන, ආනන්ද, අනුරුද්ධ, බුද්ධරක්ඛිත යන හිමිවරු එකළ විසූ විදග්ධ පැවිදි පඬිවරයෝ ය. (නිකාය සංග්‍රමය 22) යන ප්‍රකාශ වලින් තහවුරු වේ. අනුරුද්ධ හිමි අනුරුද්ධ ශතකය, නාගසේන හිමි

මානාවුලු සංදේශය (පාලි සාහිත්‍ය 142 මලලසේකර) ආනන්ද හිමි උපාසක ජිනාලංකාරය (Epigraphia Zeylonica vol.iv. 71) ලියනු ලැබ ඇත.

5 වන සියවසේ සිට 13 සියවස දක්වා ග්‍රන්ථ විමසන විට ද පැහැදිලි වනුයේ භික්ෂු වගකීමෙන් ග්‍රන්ථ බිහි වූ වගයි. නිදසුන් ලෙස ධර්මසේන හිමි පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය, ගුරුළුගෝමී අමාවතුර, ධර්මප්‍රදීපිකාව, අනෙකුත් නිර්නාමික ලේඛකයන් කළ ජාතක අටුවා ගැටපදය, පරිවාර ගැටපදය, වෙසතුරු දා සන්නය, ජානකීහරණය, විසුද්ධි මාර්ගය, මේඝදූත සන්නය, සමන්ත පාසාදිකා යන කෘති වලින් මෙය සනාථ වේ.

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගය (1,400-1,581) වන විට ද ලේඛන කලාවේ පුරෝගාමීත්වය භික්ෂූන් අතම පැවතුන බවට සාක්ෂි ඇත. එකල වැඩ විසූ වීදාගම මෛත්‍රිය හිමි ලෝවැඩ සඟරාව, කව් ලකුණු මිණිමල, බුදුගුණ අලංකාරය, එළු අත්තනගලුවංශය ලියා ඇත. තොටගමුවේ රාහුල හිමි පරෙවි සංදේශය, සැළලිහිණි සංදේශය, කාව්‍යශේඛරය, පංචිකා ප්‍රදීපය, වෑත්තෑවේ හිමියන් ගුත්තිලකාව්‍යය යනාදි වශයෙන් ග්‍රන්ථකරණයේ යෙදී ඇත. මහනුවර යුගයේ වැලිවිට ශ්‍රී සංඝරාජ හිමියන් ප්‍රමුඛ යතිවරුන් විසින් කරන ලද ග්‍රන්ථ සාහිත්‍ය තුළින් ද පැහැදිලි වනුයේ, ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන භික්ෂු කර්තෘත්ව සාධකය මත බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස විකාශනය වූ බවයි.

**තොරතුරු මධ්‍යස්ථාන උගතුන් සතුවීම (භික්ෂු පාථකත්වය)**

ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන උගතුන් සතු වීම ද බෞද්ධ උරුමයක් ලෙස එය බිහි වීමේ පසුබිම හුවා දක්වයි. අතීතයේ උගතුන් ලෙස සමාජ සම්භාවනාවට වැඩි වශයෙන් ලක් වූයේ භික්ෂූන් ය. රාජකීයයන් එයට දෙවන මට්ටමේ ලා සැලකිණි. සමාජ සංවිධානය තුළ යතිවරුන් දැන උගතුන් ලෙස වැදගත් වීමත්, ලෞකික හා ලෝකෝත්තර කටයුතු වල දී උපදේශකයන් ලෙස වැදගත් වීමත් යනාදී කරුණු මත තොරතුරු මධ්‍යස්ථාන පරිහරණය භික්ෂූන්ට සීමා විය. සාමාන්‍ය ජනයාට ඒවා ළඟාවිය නොහැකි පූජනීය වස්තූන් විය. ග්‍රන්ථකරණය යතිවරුන් සතුවීමත්, ලේඛන මාධ්‍ය ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම ඔවුන් සතු වීමත්, ලේඛන මාධ්‍ය දුර්ලභ වීමත්, තොරතුරු මධ්‍යස්ථාන ඔවුන් සතු වීමට හේතු විය. පැරණි තොරතුරු මධ්‍යස්ථාන උගත් භික්ෂූන්ට පමණක් සීමා වූ බවට පැහැදිලි නිදසුනක් ලෙස බුද්ධඝෝෂ හිමි මහාවිහාර පුස්තකාලය පරිහරණයට එම විහාරස්ථ හිමිවරුන්ගෙන් අවසර ඉල්ලා සිටි අවස්ථාව දැක්විය හැකිය. බුද්ධඝෝෂ හිමියන්ට තම ධර්ම ඥානය තහවුරු කරනු වස් "විසුද්ධි මග්ගය" ලියා දැක්වීමට සිදු වීමත් ඉන් පසු මහා විහාර පුස්තකාල පරිහරණයට අවස්ථාව ලැබීමත් සිදු විය.

**ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන, බෞද්ධ ධර්ම ශාස්ත්‍රිය තොරතුරු මාධ්‍ය සඳහා සීමා වීම**

මෙය ද බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බිහි වීම සනාථ කරන සාධකයකි. එකල පොත් පත් බිහි වීම බහුලව භික්ෂූන්ගෙන් සිදු වීමත්, ඒ සඳහා ධර්ම ශාස්ත්‍රිය කරුණු වැඩි වශයෙන් පදනම් කර ගැනීමත් මෙයට හේතු වන්නට ඇත. ආගම පදනම් කරගෙන ග්‍රන්ථකරණය සිදු විය. ආගමික මතවාදයන්ගේ පරස්පරතා මත පමණක් ඒවායේ සුළු සුළු වෙනස්කම් දක්නට ඇත. ථේරවාදි හා වෛතුල්‍යවාදි අදහස් මේ සඳහා බලපා ඇත.

බෞද්ධ ධර්මය පදනම් කර ගනිමින් ග්‍රන්ථකරණය සිදු වූ බව "මහා අට්ඨකතාව", "කුරුන්දී අට්ඨකතාව" යනුවෙන් බිහි වූ මුල්ම හෙළටුවා තුළින් පැහැදිලි වේ. ආදි කාලීන ලේඛකයෙක් ලෙස බුද්ධඝෝෂ හිමියන් විසින් පාළි අටුවා ලියා ඇත්තේ මෙම අටුවා පදනම් කරගෙන ය. බුද්ධඝෝෂ හිමියන්ට සමකාලීන ලේඛකයෙකු වූ බුද්ධදත්ත හිමියන් විසින් කරන ලද "විනය විනිච්ඡය", "උත්තර විනිච්ඡය", "අභිධම්මාවතාරය", "බුද්ධවංශ අටුවාව", "රූපාරූප විභාගය" යනාදි කෘති වලින් ද පැහැදිලි වනුයේ ආගමික පරිසරය ග්‍රන්ථකරණය සඳහා මූලික වූ බවයි. මේ අනුවම යමින් මහානාම හිමියන් "මහාවංශය" හා " සද්ධම්මප්පකාසිනී" යන ග්‍රන්ථ ලියා ඇත. පසු කාලීනව ආගමික පරිසරය තුළම වෙනත් විෂය ශික්ෂණ මත ලියවුන පොත්පත් තොරතුරු මධ්‍යස්ථාන වලට එකතු වී ඇත. මේ බව මහානාම හිමියන් කළ මහාවංශය, සද්ධම්මප්පකාසිනී, පටිසම්භිදා අටුවාව, 9 සියවසේ සේන රජ විසින් කළේ යැයි සැළකෙන කාව්‍යාලංකාරයක් වූ " සියබස්ලකර", 13 සියවසේ භද්‍ර ස්ථවිරයන් කළ "එළු සඳැස් ලකුණ", බුද්ධදාස රජු කළ "සාරාර්ථ සංග්‍රහය", අනවමදස්සී හිමි කළ "සිදත් සඟරාව" සාක්ෂි දරයි.

පැරණි පුස්තකාල ග්‍රන්ථ සම්භාර පිළිබඳ ව විමසන විට පැහැදිලි කරුණක් වනුයේ ඒවා පාළි, සිංහල, සංස්කෘත භාෂාගතව ලිය වී ඇති බවයි. පාළි අත් පිටපත් අතර පෙළ පොත්, අටුවා සහ පෙළ පොත් වලට අයත් නොවන වංශ කතා ද විය. සිංහල ගද්‍ය, පද්‍ය සාහිත්‍ය කෘති අතර පැවිදි විනය ග්‍රන්ථ, සූත්‍ර පරිවර්තන, ගැටපද පරිවර්තන, ධර්ම සංග්‍රහ, බුදුගුණ වැනුම් ආදීය දක්නට ඇත. පද්‍ය ග්‍රන්ථ අතර සංස්කෘත, පාලි, පරිවර්තන, අලංකාර කාව්‍ය, සංදේශ, උපදේශ කාව්‍ය, හටන් කවි, බුදුගුණ හා භක්ති කාව්‍ය වේ. කාලාවතරණයත් සමඟ ව්‍යාකරණ කෝෂ ග්‍රන්ථ, කාව්‍ය ශාස්ත්‍ර, වෛද්‍ය, ජ්‍යෝතිෂ්‍ය වැනි විද්‍යා දියුණු වූ බව දක්නට ඇතත්, ඒවා ද ආගමික පසුබිමක් තුළ නිර්මිත කෘති බව ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථානවල ගබඩා කර තිබූ සම්භාර වලින් කැපී පෙනේ. අනුරාධපුර යුගයේ මහා විහාරය හා අභයගිරිය අතර වූ ථේරවාදී හා වෛතුල්‍යවාදි ආගමික

මත අනුව විවිධ විෂය ශික්ෂණගතව පොත පත බිහි වුණ ද, ඒවා පොදු බෞද්ධ පසුබිමක් සහිතව බිහි වීම ඉහත මතය සනාථ කරන්නකි.

පොළොන්නරු යුගය වන විට ද මෙම තත්ත්වය එක සේ පැවතිනි. පොළොන්නරු යුගයේ විසූ අනුරුද්ධ හිමි කළ "අභිධර්මාර්ථ සංග්‍රහය", "නාම රූප විනිශ්චය, ආනන්ද වනරතන හිමි කළ "පරමත්තප්පකාසිනී", ශාරිපුත්‍ර හිමි කළ " සාරාර්තදීපනී" "විනය ටීකාව", "සාරාර්ථ මංජුසා", "අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය" ගුරුළුගෝමි පඬිතුමා කළ "ධර්ම ප්‍රදීපිකාව", "අමාවතුර" හා එකල බිහි වූ කර්තෘ අවිඥාත කෘතිවන "වෙසතුරුදා සන්නස" "මුවදෙව්දාවත" සසඳාවත", "මහා බෝධිවංශ ගැටපද විවරණය", "ජාතික අටුවා ගැටපදය", "පරිවාර ගැටපද සන්නය" (ධර්ම කීර්ති හිමි, 1996) යනාදි බෞද්ධ සම්භව්‍ය කෘති වලින් ද ඉහත කරුණු පැහැදිලි වේ. දඹදෙණි යුගයේ දී ආරණ්‍යක මේධංකර මා හිමි (නිකාය සංග්‍රහය, 22 පි) "විනයාර්ථ සමුච්චය", "ජින චරිතය", "පයෝග සිද්ධිය" යන කෘති ලියනු ලැබ ඇත. මෙ කල ම අනවමදස්සී හිමි විසින් "දෛවඥ කාමධෙනු", "සිදත් සඟරාව", " පරෝපකාරය", "යෝගාර්ණවය", "ප්‍රයෝග රත්නාවලිය", දෙවන පරාක්‍රමබාහු රජ " වන විනිස මහා සන්නය", "විසුද්ධි මාර්ග මහා සන්නය", "කව් සිළුමිණ", විද්‍යාවචක්‍රවර්ති "බුත්සරණ", "දහම් සරණ", "සඟසරණ" යන කෘති ලියනු ලැබ ඇත. කුරුණෑගල යුගයේ දි "පන්සිය පනස් ජාතක පොත" ලියා ඇත. එකල ම විල්ගම්මුල හිමි "සූර්ය ශතක සන්නය", "අනාගතවංශය", "සිංහල බෝධිවංශය", " සඳකිඳුරු දා කව" ලියනු ලැබ ඇත. ගම්පොළ යුගයේ දී සීලවංශ ධර්මකීර්ති හිමි " පාරමී ශතකය", "සද්ධර්මාලංකාරය", "බාලාවතාර සන්නය", "ජනබෝධාවලි" යන කෘති කරනු ලැබ ඇත. කෝට්ටේ යුගයේ දි විමලකීර්ති ධම්මදින්න හිමි " සද්ධර්මරත්නාකරය", තොටගමුවේ ශ්‍රී රාහුල හිමි "පරවි සංදේශය", වීදාගම මෛත්‍රය හිමි "ලෝවැඩ සඟරාව", "බුදුගුණාලංකාරය", "දහම්ගැට මාලාව", " කව් ලකුණු මිණිමල", "හංස සන්දේශය", "එළු අත්තනලු වංශය" ලියා ඇත. වෑත්තෑවේ හිමි "ගුත්තිල කාව්‍ය" හා කර්තෘ අවිඥාත පැරකුම්බා සිරිත, ගිරා සංදේශය, චූල බෝධි වංශය වැනි කෘති මෙ කල ලිය වී ඇත. සීතාවක යුගය තුළ අලගියවත්ත මුකවෙටි පඬිතුමා "සැවුල් අස්න", "දහම් සොඬකව", "කුස ජාතක කාව්‍ය", "සුභාෂිතය", "කොන්ස්තන්තීනු හටන" යනාදි බෞද්ධාගමික කෘති කරනු ලැබ ඇත. මහනුවර යුගයේ දී වැලිවිට සංඝරාජ හිමි (සරණංකර සංඝරාජ සමය, 236 පිටුව) "මුණිගුණාලංකාරය", අභිසම්බෝධි අලංකාරය", "සාරාර්ථ සංග්‍රහය", "සතර සංග්‍රහය", "සතර බණවර සන්න", "රූප මාලාව", තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධ රක්ඛිත හිමි "ශ්‍රී ධර්මාවාද සංග්‍රහය", "මහාවංශය", (අවසාන කොටස) "සතිපට්ඨාන සූත්‍රය" ලියන ලදී .

උක්ත තොරතුරු පරිදි රාජ්‍ය පාලන යුග වශයෙන් විකාශනය ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ ලිය වී ඇති බෞද්ධ ආගමික පසුබිමක් සහිත කෘති වලින් පැහැදිලි වනුයේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන කාලීනව විවිධ දිශානති යටතේ වර්ධනය වුව ද, එහි පදනම බෞද්ධ සංස්කෘතික උරුමයෙන් විතැන් වී නොගිය බවය.

**තොරතුරු මාධ්‍ය පුස්කොළ පොත් මාධ්‍ය වශයෙන් පැවතීම**

ශ්‍රී ලාංකේය ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ උරුමයක් ලෙස විකාශනය වීම තහවුරු කෙරෙන ප්‍රබල සාධකයක් ලෙස මෙය විශේෂ වේ. එකල පුස්තකාලයන්හි තොරතුරු මාධ්‍ය ලෙස පුස්කොළ පොත් බහුලව භාවිත වීමෙන් එය පැහැදිලි වේ. එදා පැවති තාක්‍ෂණික පසුබිම තුළ පුස්කොළ පොත් දියුණු මට්ටමක පැවතීම ඊට හේතු වන්නට ඇත. ලේඛන මාධ්‍යයක් ලෙස පුස්කොළ වලට වැඩි වැදගත්කමක් ලැබීමත්, දේශියව තල්කොළ වලින් පුස්කොළ පොත් නිපදවා ගත හැකි වීමත්, ඒවා සුලභව පැවතීමේ පහසුවත් මේ සඳහා හේතු වන්නට ඇත.

බුදු සමයේ උරුමයක් ලෙස ලක්දිව පුස්කොළ පොත් ලේඛන කලාවේ ආරම්භය නිශ්චිතව දැක්වීම අපහසු වුව ද, ක්‍රිස්තු පූර්ව 3 සියවසේ පමණ සිට ලංකාවේ ලේඛන කලාව පැවති බව ගල්ලෙන්වල පිහිටුවා තිබූ සෙල්ලිපි වලින් තහවුරු වේ. මහින්දාගමනයෙන් පසු ධර්මය ආරක්‍ෂා කර ගැනීමේ අවශ්‍යතාව මත ඒවා ලේඛනගත කිරීම ආරම්භ වී ඇත. ධර්මය පුස්කොළ පොත්වල ලියා තැබීමේ ආරම්භත අවස්ථාවක් ලෙස "චුල්ලවග්ග" නමැති විනය ග්‍රන්ථය ලංකාවෙන් සොයා ගත් පැරණිම පුස්කොළ පොත යයි ඉතිහාසඥයින් අනුමාන වශයෙන් සලකති. එම පොතේ පිටපතක් ලංකා ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පොත් අතර වේ (වීරසූරිය 2006 පි 64). මේ පිළිබඳ කරුණු දක්වන (වීරසූරිය 2006 පි 61) "ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාවේ ආරම්භය නිශ්චය අපහසුය. එය වළගම්බා රජ සමයටත් පැරණි බව කිව හැකිය. මාතලේ අළු විහාරයේ දී වළගම්බා රජ දවස කරන ලද සංගායනාවේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ පුස්කොළ පොත් වලය" පවසයි.

මුල්ම ඓතිහාසික මහා පරිමාන ලේඛන සාහිත්‍යයක් (ලගමුව 2006.පි 61) පිළිබඳ තොරතුරු අනාවරණය වන්නේ මිහිඳු හිමියන් විසින් සංග්‍රහ කරන ලද හෙළ අටුවා පිළිබඳ ඓතිහාසික තොරතුරු වලිනි. මිහිඳු හිමියන් ගෙනා පාලි අට්ඨ කතා සාහිත්‍ය හෙළ බසට නගන ලද බව පාලි අට්ඨකතා වලත් සිංහල සාහිත්‍ය කෘතිවලත් සඳහන් වේ. ක්‍රිස්තු වර්ෂ 5 වන සියවසේ දී බුද්ධඝෝෂ හිමියන්ට පාලි අට්ඨ කතා ලිවීම සඳහා උපස්ථම්භ වී ඇත්තේ හෙළ අටුවා වේ. මෙම හෙළ අටුවා

පුස්කොළ පොත් මාධ්‍ය වශයෙන් පැවතිනි. බුද්ධඝෝෂ හිමියන් අටුවා සම්පාදනය සඳහා මහා විහාර භික්ෂුන්ගෙන් සිංහල භාෂාගත හෙළ අටුවා ඉල්ලනු ලැබ ඇත. (ම.ව. 37, 234 ගාථාව)

සම්භාව්‍ය බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ පැහැදිලි කරුණක් වනුයේ, පුස්කොළ පොත් ලේඛන කලාව එකල විහාරාරාම හා විද්‍යායතන වල ප්‍රගුණ කළ විෂයක් බවයි. පුස්කොළ පොත් නිෂ්පාදන තාක්ෂණය එකල විහාරාරාම අධ්‍යාපන ක්‍රියාවලිය හා අනන්‍යව පැවති බව පෙනේ. "ඒ බව ක්‍රිස්තු වර්ෂ 10 සියවස වන විට තල් ගස් කැපීම සම්පූර්ණයෙන් ම තහනම් කර නියෝග පනවා ඇති බව 4 වන සියවසේ මිහිඳු රජුගේ මිහින්තලේ පුවරු ලිපියෙන් හා "උදා මහයා" සෙනෙවියාගේ පුලියන්කුලම පුවරු ලිපියෙන් තහවුරු වේ (ලගමුව 2006. පි 65). මෙයින් පැහැදිලි වනුයේ, පුස්කොළ පොත් ලේඛන කලාවේ සංවර්ධනය සඳහා රාජානුග්‍රහය ලැබී ඇති බවයි. ඇතැම් රජවරු තමන් විසින් ම ග්‍රන්ථකරණයේ නියලීමෙන් එය සනාථ වේ. පස්වන කාශ්‍යප රජු "දම්පියා අටුවා ගැටපදය" සේන රජු "සියබස්ලකර" බුද්ධදාස රජු "සාරාර්ථ සංග්‍රහය" යනාදි ග්‍රන්ථ කරනු ලැබ ඇත.

පුස්කොළ පොත ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන තුළ බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස වැදගත් වූ බව " පුස්කොළ යන වදනින් කියවෙනුයේ කිසිවක් ලියා නොමැති තල් කොළය යන්නයි. කිසිවක් ලියා නොමැති පුස්කොළ මිටියක් පුස් ගෙඩිය, පොත් ගෙඩිය ලෙස හඳුන්වයි. (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය 1970.පි.631) පොත් ගෙඩිය ලිවීමෙන් පසු "පොත් වහන්සේ" ලෙස හඳුන්වයි." යන්නෙන් පැහැදිලි වේ.

පුස්කොළ පොත් ලේඛන කලාව බෞද්ධ සංස්කෘතික පදනමක් මත බිහි වූ බව තහවුරු කෙරෙන සාධකයක් ලෙස පුස්කොළ නිෂ්පාදන ක්‍රමවේදය තුළින් ද හඳුනාගත හැකි ය. පුස්කොළ පොත් සෑදීමේ මුල් පියවර තල් කොල කපා තම්බා වියළා ලේඛනයට සුදුසු පරිදි සකසා ගැනීමයි. මෙම කාර්යයේ නියැලෙන්නන් මස්මාංශ, සුරාසුදුවෙන් වැළකී යහ ක්‍රියාවෙන් කල් ගෙවීමත්, තල් ගොබ කැපීම පුර පස නැකැත් බලා දේව කාර්යයක් ලෙස කළ යුතු වීමත්, තල් ගොබ ගෙන ඒම ගෞරව සම්ප්‍රයුක්තව පෙරහැරකින් කළ යුතු වීමත් අනිවාර්ය කටයුතු විය. පුස්කොළ පොත් ලේඛනයේ දී එහි ආරම්භය "ස්වස්ථි සිද්ධම්", "නමෝ බුද්ධාය" වශයෙන් සටහන් යෙදිණි. එහි අවසානය "සිද්ධි මස්තු", "ආරෝග්‍ය මස්තු" යනුවෙන් සටහන් විණි. මෙයින් පෙනී යන්නේ පුස්කොළ කර්මාන්තය ලාංකේය සංස්කෘතිය තුළ ජාතික උරුමයක් ලෙස බිහි වූ බවයි. මෙම කලාවට ම ආවේණික උප සංස්කෘතික පදනමක් තුළ ගෞරව සම්ප්‍රයුක්ත කාර්ය භාරයක් ලෙස මෙය සමාජගත වූ බවයි.

මෙලෙස විකාශිත පුස්කොළ පොත් නිෂ්පාදන කර්මාන්තය දැනුම මාධ්‍යයක් ලෙස ශ්‍රී ලාංකේය සමාජය විෂයෙහි ලා කළ බලපෑම හඳුනා ගත හැකි ඓතිහාසික සාධක රාශියකි. බුරුමයේ සුමංගල නම් ලේඛකයා විසින් රචිත " බුද්ධඝොසුප්පත්ති" කෘතියේ සඳහන් පරිදි, සිංහල අටුවා පාලියට නැගීමෙන් පසු ඒවා ගොඩ ගැසූ පසු මධ්‍යම තරමේ ඇතුන් 7 දෙනෙකුගේ උසැති ප්‍රමාණයක් වූ බවත්, ඒවා මහා සෑය අසල දී ගිනි තබා විනාශ කළ බවත් (බුද්ධඝෝසුප්පත්ති පි. 50) යන ප්‍රකාශය වැදගත් වේ. මෙයින් එ කල පුස්තකාලයන්හි පැවති පුස්කොල පොත් ප්‍රමාණය පිළිබඳ ව යම් දළ අදහසකට පැමිණිය හැකිය.

ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන ආශ්‍රිතව එදා පැවති පුස්කොල පොත් නිෂ්පාදන කර්මාන්තයේ ස්වභාවය සහ ආකාරය (ලගමුව 2006,පි.66) මෙසේ සඳහන් කරයි. "විශේෂයෙන් ම ක්‍රි.පූ. 3 සියවසේ හෙළ අටුවා රචනා කිරීමත් ක්‍රිස්තු පූර්ව 1 සියවසේ වළගම්බා රජු දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් ක්‍රි.පූ. 5 සියවසේ බුද්ධඝෝෂ හිමි පාලි අටුවා ලිවීමත් යන මහා පරිමාණ ආගමික ලේඛන කාර්ය තුන ගැන පමණක් කල්පනා කර බලන විට 84,000ක් බන්ධ හා දස ලක්ෂ තුනක් ශබ්ද සහිත ත්‍රිපිටකයක් ඊට අදාළ ව්‍යඛ්‍යානත් ග්‍රන්ථාරූඪ කිරීමට තල්කොල වැනි සුලභ වූ කල් පවත්නා වූ පහසුවෙන් සකසා ගත වූ ද ලේඛන මාධ්‍යයක් හැර වෙනත් කිසිදු ද්‍රව්‍යයක් භාවිතා කළ බව කෙසේවත් පැවසිය නොහැකි ය." මෙය එදා පැවති පුස්කොල පොත් ලේඛන කලාව පිළිබඳ අනන්‍ය සාධාරණ ප්‍රකාශනයකි.

ශ්‍රී ලාංකේය සාහිත්‍ය ඉතිහාසය තුළ විද්‍යස්ථාන හා බද්ධව තොරතුරු මධ්‍යස්ථාන බිහි වීමේ විශේෂ අවධියක් ලෙස කෝට්ටේ යුගයේ ලේඛන මාධ්‍ය පුරානය ආශ්‍රිතව ද මේ සම්බන්ධව හඳුනා ගත හැකි තොරතුරු රාශියකි. එකල තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම ශ්‍රී ඝනානන්ද, ඉරුගල්තිලක, පැපිලියානේ සුනේත්‍රා දේවි ආදී විද්‍යාස්ථාන හා පිරිවෙන් ආශ්‍රිතව බිහි වූ තොරතුරු මධ්‍යස්ථාන වල තොරතුරු මාධ්‍ය ලෙස පුස්කොල පොත් බහුලව භාවිත වී ඇත. පැපිලියාන සෙල්ලිපිය මේ බව මනාව තහවුරු කර දක්වයි.

මහාචාර්ය පී.ඊ.ඊ ප්‍රනාන්දුට අනුව 13 සියවසේ දඹදෙණි යුගය තුළ විරචිත දැනට සුරක්ෂිතව ඇති පැරණි පුස්කොල පොත් 4 කි. එනම් 1. චුල්ල වග්ගය (කොළඹ ජාතික කෞතුකාගාරය), 2. විසුද්ධි මග්ගය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) 3. සරාත්ථදීපනී විනය අටුවාව - පළමු කාණ්ඩය (ලන්ඩන් බ්‍රිතාන්‍ය කෞතුකාගාරය) හා 4. සරාත්ථදී පනී පිටපත (පැරිස් නුවර බ්‍රිතාන්‍ය පුස්තකාලය) යන ඒවා වේ. මේවායින් ද පැහැදිලි වනුයේ පුස්කොල පොත් ලේඛන මාධ්‍ය පැරණි පුස්තකාල ආශ්‍රිතව බොහෝ උරුමයක් ලෙස විකාශනය වූ

ආකාරය යි. මේ අනුව පැහැදිලි කරුණක් වනුයේ, ක්‍රි.පූ. 5 සියවසේ සිට ක්‍රි.ව. 19 සියවස දක්වා ලක්දිව පුස්කොල පොත් ලේඛන කලාව බෞද්ධ උරුමයක් ලෙස අඛණ්ඩව විකාශනය වූ බවයි. 1937 දී ලන්දේසීන් විසින් කඩදාසි මත මුද්‍රණ ශිල්පය හඳුන්වා දෙන තෙක් අවිච්ඡින්නව මෙම තත්ත්වය පැවති බවයි.

**පෙරදිග භාෂා ආශ්‍රිතව ග්‍රන්ථකරණය**

ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස විකාශනය තහවුරු කෙරෙන තවත් විශේෂ සාධකයක් වනුයේ, එම තොරතුරු මධ්‍යස්ථානයන්හි තොරතුරු මාධ්‍ය පෙරදිග භාෂා ආශ්‍රිතව පමණක් ග්‍රන්ථාරූඪ වී තිබීමයි. මේ අනුව ආදි තොරතුරු මධ්‍යස්ථාන වල තොරතුරු මාධ්‍ය වල ප්‍රධාන භාෂා මාධ්‍ය වී ඇත්තේ හෙළ බස, පාළි හා සංස්කෘතික භාෂාවයි. මෙම භාෂාත්‍රය බෞද්ධ සංස්කෘතික උරුමයන් පවත්වා ගෙන යාමේ මාධ්‍ය ලෙස විශේෂ වැදගත්කමක් දරන බව, මෙරට ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන විකාශය තුළ පැහැදිලිව හඳුනා ගැනීමට ඇත. මේ අනුව ආදී කාලීන පුස්තකාල ග්‍රන්ථයන්හි ප්‍රධාන හා මූලික භාෂාව වී ඇත්තේ හෙළ බසයි. මහින්දාගමනයට පෙර අප රටේ භාවිත මූලික භාෂාව වූයේ හෙළ බසයි. දේශීය සාහිත්‍යයේ ආරම්භක භාෂාව වී ඇත්තේ හෙළ බසයි. ඒ නිසා පෙළ දහම සිංහල විය. "සිහළට්ඨකථා" හෙවත් "සිංහල අටුවා" සාහිත්‍යයක් බිහිවනුයේ මෙම පසුබිම තුළය. "බුද්ධඝෝෂ හිමි" මෙ රටට පැමිණ සිංහල අටුවා පාළි අටුවා බවට පෙරළිමෙන් සනාථ වනුයේ, මුලින් ම මෙරට සිංහල ග්‍රන්ථකරණයක් තිබූ බවයි. මේ අනුව බුද්ධඝෝෂ හිමි විසින් "සමන්තපාසාදිකාවේ" සඳහන් වන පරිදි, " මහාඅට්ඨකථා", "මහා පච්චාරි අට්ඨකථා", "කුරුන්දි අට්ඨකථා", යනාදි වූ සිංහල අට්ඨකථා රාශියක් පාළියට නගනු ලැබ ඇත.

මුලින් ආරම්භ වූ සිංහල ග්‍රන්ථකරණය දුටුගැමුණු රජුගේ "පුන්‍ය පුස්තකය", මේඝවර්ණ රජු දවස කළ "සිංහල බුද්ධවංශය", මහානාම රජු දවස කළ "සිංහල බෝධිවංශය", සහ පසුව ලියන ලද "පුරාණ කුස ජාතක කාව්‍ය", " අසක්දාකව", "සියබස්ලකර", "ධම්පියාඅටුවා ගැටපදය", "සිඛ වළඳ විනිස", " මුවදෙව්දාවත", "සසදාවත", "විරිත් සන්නය"යන ග්‍රන්ථ වලින් පැහැදිලි වේ. පොළොන්නරු හා දඹදෙණි යුගයන්ට අදාළව ලියවුණු "බුත්සරණ", "දම් සරණ", " සඟ සරණ" "සද්ධර්මරත්නාවලිය", "පූජාවලිය" "කව්සිළුමිණ", "සිදත් සඟරාව", සහ කුරුණෑගල යුගයේ ලියවුන "පන්සිය පනස් ජාතකය", "සිංහල අනාගත වංශය", "දළදා සිරිත", "උමංදාව" යන කෘති සහ කෝට්ටේ යුගයේ ලියවුන "ගිරා", "සැළලිහිණි", "හංස" යනාදි සංදේශ කාව්‍ය වලින් පැහැදිලි වනුයේ ද එ කල තොරතුරු මධ්‍යස්ථාන ආශ්‍රිතව පැවති සිංහල ග්‍රන්ථ සම්භාරය යි. මෙම සිංහල ග්‍රන්ථ සම්භාරය සිංහල ගද්‍ය, පද්‍ය, ධර්ම සංග්‍රහ, බුදුගුණ වැනුම්, සූත්‍ර

පරිවර්තන. ගැට පද, අටුවා, භාෂා වියරණ, ඓතිහාසික වංශ කථා, යනාදි විවිධ ග්‍රන්ථ වලින් පෝෂිතව පැවති බව පැහැදිලි ය.

පාළි භාෂාව ද බෞද්ධ සංස්කෘතිය තුළ විශේෂ උරුමයකි. හේතුව බුදුන් වහන්සේගේ මවු බස මාගධ ප්‍රකෘත භාෂා විශේෂයක් වන පාළි භාෂාව මත පදනම් වීමත්, මිහිඳු හිමි ප්‍රමුඛ දූත පිරිස එම බස ව්‍යවහාර කිරීමත් ය. මෙය පුංචි බණ්ඩාර සන්නස්ගල මහතා යට සඳහන් ලෙස තහවුරු කර දක්වයි. "බුදුරදුන්ගේ මවුබසත් මාගධ ප්‍රකෘතයකි. එයින් නිපද වූ සාහිත්‍ය හෙවත් බුදුන් වදාළ ශ්‍රී මුඛ ධර්මපාය නිසා ගොඩ නැගුණු සාහිත්‍ය පාළි නාමයෙන් පහළ වී තිබේ. එහෙයින් පාළි සාහිත්‍යයේ නිර්මාතෘ බුදුරදුන් බවට සැකයක් නැත" (සන්නස්ගල 1961 .පි. 14)

උක්ත පසුබිම මත පැරණි පුස්තකාල සම්ප්‍රදාය පාළි භාෂා ග්‍රන්ථ සම්භාර වලින් පරිපෝෂිතව ඇති බව හඳුනා ගත හැකිය. මෙහි දී පාළි ග්‍රන්ථ සම්භාරය තුළ අත් පිටපත්, පෙළ අටුවා පරිවර්තන, අටුවා, ටීකා, ගැටපද, විවරණ, වංශ කථා යනාදි විවිධ තේමා ගත කෘති හැදිනිය හැකිය. මේ අනුව "බුද්ධඝෝෂ" හිමි විසින් "මනෝරථපූරණී", "පරමත්තජෝතිකා", "සුමංගල විලාසිනී", " ධම්මපදට්ඨකථා", "විසුද්ධි මග්ග", "සමන්ත පාසාදිකා", "අත්ථසාලිනී" යනාදී වශයෙන් පාළි ග්‍රන්ථකරණයක් සිදු කරනු ලැබ ඇත (සන්නස්ගල :1961,පි.14). එකල විසූ ප්‍රකට භික්ෂු දෙනමක් වන බුද්ධදත්ත හා ධම්මපාල හිමිවරුන් විසින් පාළි ග්‍රන්ථ රාශියක් බිහි කරනු ලැබ ඇත. ධම්මපාල හිමි විසින් "පරමත්තදීපනී (ඉතිවුත්තකට්ඨකථා), පරමත්තදීසනි (චරියාපිටකට්ඨකථා), පරමත්තදීපනී (ප්‍රේතවස්තු අට්ඨකථා) වශයෙන් අටුවා රාශියක් ද, බුද්ධදත්ත හිමි විසින් " මධුරත්ථදීපනී" යන පාළි ග්‍රන්ථ කරවනු ලැබ ඇත. මහානාම හිමි " සද්ධම්මප්පකාසිනී" උපසේන හිමි "සද්ධම්මපරෝතිකා" වශයෙන් ද පාළි ග්‍රන්ථ බිහි කරනු ලැබ ඇත (සන්නස්ගල : 1961.පි.14).

බෞද්ධ සංස්කෘතික උරුමය තුළ සංස්කෘත භාෂාවට හිමිවනුයේ ද, ප්‍රබල ස්ථානයකි. ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන සංස්කෘත භාෂාගත කෘති වලින් පරිපූර්ණව පැවති බවට සාධක හඳුනා ගැනීමට ඇත. ක්‍රිස්තු වර්ෂ 5 සියවස පමණ වනවිට පාළි හා සිංහල සාහිත්‍ය යටපත් වීමක් දක්නට ඇත. මේ සඳහා සකු සාහිත්‍ය සහ මහායාන බුදු සමය බලපෑම් කළ බව පෙනේ. එකල භාරතය හා පැවති සමාජ, ආර්ථික, සංස්කෘතික සම්බන්ධතා මෙයට හේතු වන්නට ඇත. ග්‍රන්ථකරණයෙහිලා සංස්කෘත භාෂාවේ බලපෑම "පොළොන්නරු සමයේ පටන් සංස්කෘතය සිංහල භාෂාව කෙරෙහිත් සමාජය කෙරෙහිත් වඩ වඩාත් බලපාන්ට වූයේය" (තිලකසිරි 1958) යනුවෙන් ජේ. තිලකසිරි මහතා "වෛදික සාහිත්‍ය" ග්‍රන්ථයෙහි තහවුරු කරනු ලබයි. සංස්කෘත ග්‍රන්ථ සම්භාර අතර ගද්‍ය,

පද්‍ය, භාෂා ව්‍යාකරණ, ජ්‍යෝතිෂය, ආගමික යනාදි විවිධ තේමාගත කෘති හඳුනා ගැනීමට ඇත. ඒ අතර මහායානිකයන්ගේ භාෂා මාධ්‍ය වූ සංස්කෘත ඇසුරින් "අෂ්ට සහශ්‍රික ප්‍රඥා පාරමිතා", "සද්ධර්ම පුණ්ඩරිකය", "ලාලිත විස්තරය", "ලංකාවතාර සූත්‍රය", "ස්වර්ණ ප්‍රභාස සූත්‍රය", "ගණ්ඩව්‍යුහ", "කාරාණ්ඩ ව්‍යුහ", " අපදාන ග්‍රන්ථ", "මහායාන දස භූමිනු" යන ග්‍රන්ථ පැරණි පුස්තකාල සම්භාර ලෙස හඳුනා ගැනීමට ඇත.

මෙම තොරතුරු වලින් තහවුරු වනුයේ ද, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථානයන්හි තොරතුරු සම්භාර බෞද්ධ සංස්කෘතික උරුම ලෙස වැදගත් හෙළ, පාළි හා සංස්කෘත භාෂාත්‍ර මත පදනම් ව බිහි වූ බවයි.

**සමාලෝචනය**

උක්ත පර්යේෂණ ගත තොරතුරු සංයුක්තාර්ථයෙන් සළකා බලන විට පැහැදිලි වන කරුණක් වනුයේ, ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස මෙරට සංස්ථාපිතව ඇති බවයි. මහින්දාගමනය තුළින් මෙරට ප්‍රතිස්ථාපිතව මුඛ පරම්පරාගතව පැවති බුදුදහම ආරක්ෂා කර ගැනීමේ පරමාර්තයෙන් ලේඛන ගත කිරීම ආරම්භ විය. පසුව එම ලේඛන ආරක්ෂා කර ගැනීමේ අරමුණින් විහාරාරාම වලට "පොත්ගුල්" සම්ප්‍රදාය එකතු විය. මේ අනුව බෞද්ධ විහාරාරාම වලට අනුබද්ධව ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බිහිවීම, ඒ ආශ්‍රිත බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය සැකසීම, ලේඛන කලාව භික්ෂූන් සතුවීම, තොරතුරු මධ්‍යස්ථාන ධර්ම ශාස්ත්‍රිය තොරතුරු සඳහා පමණක් සීමාවීම, තොරතුරු මාධ්‍ය පුස්කොළ පොත් මාධ්‍යගතව පැවතීම, හෙළ, පාලි, සංස්කෘත භාෂාත්‍ර මත ග්‍රන්ථකරණය සිදුවීම යනාදි සාධක වලින් හෙළි වනුයේ, මෙරට ඓතිහාසික තොරතුරු මධ්‍යස්ථාන බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස විකාශනය වී ඇති බවයි. මෙම අධ්‍යයනගත තොරතුරු වත්මන් ගෝලීයකරණ සමාජ ප්‍රවාහය තුළ අතීත උරුම කළමනාකරණයේ දී, මූලොත්පායික වශයෙන් වැදගත් වනු නොඅනුමානය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කුලසූරිය, ආනන්ද (1996)*සිංහල සාහිත්‍ය 3*, ශ්‍රී දේවි. දෙහිවල

තිලකසිරි, ජේ. (1958) වෛදික සාහිත්‍ය ගොඩගේ, කොළඹ

බස්නායක, එම්.ටි. (1995) ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය. ගුණසේන කොළඹ

භාරතසිංහ (2003) පාළි සාහිත්‍යයේ ඉතිහාසය. පරි.හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි. ගොඩගේ. කොළඹ

මහාවංශය (1996) අනු. ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ඛිත හිමි. ගොඩගේ. කොළඹ

රණසිංහ, ආර්.එච්.අයි.එස්. (2006) පැරණි ශ්‍රී ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය. කර්තෘ. කැළණිය
රාජරත්නාකරය (1976) සංස්. ඒ.වී. සුරවීර. ලේක් හවුස්. කොළඹ
ලගමුව, ආරිය (2006) ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව සංස්කෘතික කටයුතු දෙපා. බත්තරමුල්ල.
වජිරඥාන හිමි, හොරණ (1992) සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා. ගොඩගේ. කොළඹ
වික්‍රමසිංහ, කේ.ඩී.පී. (1970) සිංහල ලේඛක පරපුර. ගුණසේන, කොළඹ
වීරසිංහ, ඩබ්.කේ.එම්.කේ. (2000) පුස්තකාල ඉතිහාසය. පුස්තකාල ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයකි. කර්තෘ දළුගම.
සන්නස්ගල, පුඤ්චි බණ්ඩාර (1961) සිංහල සාහිත්‍ය වංශය : ආරම්භයේ සිට ක්‍රි.ව. 1994 දක්වා. ගොඩගේ. කොළඹ
සෝරත හිමි, වැලිවිටියේ (1970) ශ්‍රී සුමංගල ශබ්දකෝෂය. කොළඹ.
හේවාමද්දුම, අමර (1998) සම්භව්‍ය සාහිත්‍යයට පිවිසුමහක් : පළමු වෙළුම. ගොඩගේ. කොළඹ

Buddhagh§uppatti or historical romance of rice and career of Buddhagb§o (1982) ed. James Gray. Luzac co. London.

Epigraphia Zeylanica. (1928) Humphrey, milford.

Muller, Edward (1984) Ancient inscriptions in Ceylon Asian Educational Services. New Delhi.

Mukarji, R.K. (1960) Ancient Indian education Bhamanical buddist. Motilal.Delhi.